ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2412/26 - 2024 නොවැම්බර් මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2024.11.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

IV (අ) වැනි කොටස - පළාත් සභා

පළාත් සභා නිවේදන

වයඹ පළාතේ පළාත් සභාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 2008.08.08 දිනැති අංක 1561/27 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මඟින් ප්‍රකාශිත වයඹ පළාතේ පළාත් සභාවේ 2008 අංක 01 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ 24 වන වගන්තිය යටතේ පනවා ඇති 2009.05.14 දිනැති අංක 1601/24 හා 2010.03.05 දිනැති අංක 1643/43 දරන *අති විශේෂ ගැසට් පත්‍ර* මඟින් ප්‍රකාශිත වයඹ පළාත් සභාවේ 2008 අංක 01 දරන සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම නියෝග මාලාවේ පහත සඳහන් නියෝග සංශෝධනය කර වයඹ පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් ප්‍රඥප්තියේ අංක 24 දරන වගන්තිය හා 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනත ප්‍රකාරව වයඹ පළාත් ආණ්ඩුකාරවර තිස්ස වර්ණසූරිය වන මා වෙත පැවරී ඇති බලතල අනුව 2024 නොවැම්බර් මස 09 දින අනුමත කරන බව මෙයින් දන්වමි.

තිස්ස වර්ණසූරිය,
ආණ්ඩුකාරවර,
වයඹ පළාත.

වර්ෂ 2024 ක් වූ නොවැම්බර් මස 09 වැනි දින,

වයඹ පළාතේ පළාත් සභාව,
කුරුණෑගලදීය.

නියෝග ක්‍රියාත්මක වන දිනය

01. *ගැසට් පත්‍රයේ* පල වූ දින සිට වයඹ පළාත සඳහා මෙම නියෝග බලාත්මක වේ.

නියෝග මාලාවේ 3 වගන්තිය සංශෝධනය කිරීම

02. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ නියෝග මාලාවේ 03 වැනි වගන්තියේ IV වන උපවගන්තියට ඉක්බිතිව පහත සඳහන් උපවගන්ති එකතු කිරීමෙන් 03 වැනි වගන්තිය මෙයින් සංශෝධනය කෙරේ.

03. V (අ). 03.I (ඇ) හා 03.II, 03.III වගන්තිවල සඳහන් කාලසීමාවන් ඉක්මවා ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කරනු ලැබූ විට 05.I නියෝගයේ සඳහන් ප්‍රතිශතයන් අනුව දායකයා හා සමිතිය විසින් හිඟ දායක මුදල් ගෙවිය යුතු අතර ඊට අමතරව දායකයා හා සමිතිය විසින් ගෙවිය යුතු හිඟ දායක මුදලින් පහත සඳහන් පරිදි අධිභාර මුදලක් ගෙවිය යුතුය. යම් හෙයකින් දායකයාගෙන් දායක වාරික අයකර සමිතිය විසින් අධ්‍යක්ෂ වෙත නොගෙවීම නිසා අධිභාර ගෙවීමකට යටත් වුවහොත් දායකයා හා සමිතිය විසින් ගෙවිය යුතු අධිභාර මුදල සම්පූර්ණයෙන්ම සමිතිය විසින්ම ගෙවිය යුතුය.

නියමිත කාලසීමාව ඉක්මවන දින සිට,

ප්‍රමාදය දින 01 සිට 30 දක්වා	5%
ප්‍රමාදය දින 31 සිට 45 දක්වා	15%
ප්‍රමාදය දින 46 සිට 60 දක්වා	30%
ප්‍රමාදය දින 61 සිට 90 දක්වා	60%
ප්‍රමාදය දින 90 ට වැඩි	100%

(ආ). මෙම සංශෝධිත නියෝග ක්‍රියාත්මක වන දිනට පෙර සමුපකාර සේවක කොමිෂන් සභා අනුමැතිය මත සමිතියේ ස්ථිර සේවයට බඳවාගෙන ඇති එහෙත් දායකත්වය ලබාගෙන නොමැති, සේවකයින්ගේ ඉල්ලුම් පත්‍ර සංශෝධිත නියෝග ක්‍රියාත්මක වන දින සිට දින 60 ක් ඇතුළත ඉදිරිපත් කළ යුතු අතර 05.I නියෝග අනුව හිඟ දායක මුදල් දායකයා සහ සමිතිය විසින් අධ්‍යාක්‍ෂවරයා වෙත ගෙවිය යුතුය. එසේ වුව ද යම් ඉල්ලුම්කරුවෙකු මෙම යෝජනා ක්‍රමයට බඳවා ගනු ලබන දින සිට වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනට මාස 60 ක සේවා කාලයක් සම්පූර්ණ නොවන්නේ නම් එම අය විසින් මෙම සංශෝධිත නියෝග ක්‍රියාත්මක වන මාසයේ ඒකාබද්ධ වැටුප පදනම්ව, 05.I නියෝගයේ සඳහන් ප්‍රතිශත අනුව වාරික 60 ක දායක මුදල් බඳවා ගන්නා දින සිට වසරක් තුළ අධ්‍යාක්ෂවරයා වෙත ගෙවිය යුතුය. විශ්‍රාම වැටුප් හිමිකම් ලැබෙනුයේ වාරික 60ක දායක මුදල ගෙවා අවසන් කළ දිනය හෝ වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය යන දින දෙකෙන් පසුව එළඹෙන දිනය අයත් වන මාසයට පසුව එළඹෙන මාසයේ සිට වේ.

(ඇ). ඉහත 03.V (ආ) හි සඳහන් සේවකයන් අධිභාර මුදලින් නිදහස් කෙරෙන අතර ඔවුන් යෝජනා ක්‍රමයට බඳවාගනු ලබන්නේ අධ්‍යාක්ෂවරයා විසින් තීරණය කරනු ලබන දිනයක සිට විය යුතුය.

නියෝග මාලාවේ 4 වගන්තිය සංශෝධනය කිරීම

03. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 4.I වගන්තිය ඉවත්කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශකර හා 4.III (ඉ) වගන්තිය ඉවත්කර 4 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. I. දායකත්වය ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍රයක් ලැබුණු විට ඉල්ලුම්කරුගේ සුදුසුකම් පිළිබඳව සපයන ලද තොරතුරුවල සත්‍යතාවය හා නිවැරදිභාවය බලය පවරනු ලැබූ නිලධාරියා විසින් තහවුරුකර ගැනීමෙන් පසු, ඉල්ලුම් පත්‍රය ලැබී දින 60 ක් ඇතුළත තම නිර්දේශය සමඟ අධ්‍යක්ෂවරයා වෙත ඉදිරිපත් කළ යුතුය.

04. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 5.I හා 5.II වගන්ති ඉවත්කර ඒ වෙනුවට පහත වගන්ති ආදේශකර, හා 5.V වගන්තිය ඇතුළත්කර 5 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. නියෝග මාලාවේ 5 වගන්තිය සංශෝධනය කිරීම

5.II වගන්තියේ පැති සටහන "ලියාපදිංචි ගාස්තුව" ලෙස ද මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5.I (අ). මෙම නියෝග මාලාව ක්‍රියාත්මක වන දිනට යෝජනා ක්‍රමයේ දායකත්වය ලබා සිටින හා මෙම නියෝග මාලාව ක්‍රියාත්මක වන දිනෙන් පසු යෝජනා ක්‍රමයට බැඳෙන දායකයකුගේ,මාසික ඒකාබද්ධ වැටුපෙන් 6% ක් අයකර සේවායෝජකයා විසින් මාසික දායකය වශයෙන් අධ්‍යක්‍ෂවරයා වෙත ගෙවිය යුතු අතර, එම දායක මුදල තම මාසික ඒකාබද්ධ වැටුපෙන් අයකර අධ්‍යක්ෂවරයා වෙත යැවීම සඳහා සේවායෝජක සමිතියට හෝ සංගමයට ලිඛිත ව බලය පැවරිය යුතු ය.

"**ඒකාබද්ධ වැටුප**" යන්නෙන් අදහස් කරනුයේ සේවකයා උපයා ගත් වැටුප් වර්ධක ඇතුළත් අදාළ මාසයේ හිමි මූලික වැටුප වේ. වෙනත් දීමනා කිසිවක් මීට අදාළ නොකර ගත යුතුය.

5.I (ආ). එසේම මාසිකව එක් එක් දායකයා වෙනුවෙන් දායකයාගේ මාසික ඒකාබද්ධ වැටුපෙන් 3% ක දායක මුදලක් සේවා යෝජක සමිතිය විසින් ද අධ්‍යක්‍ෂවරයා වෙත ගෙවිය යුතුය.

5.II. යෝජනා ක්‍රමයට බැඳෙන එක් එක් දායකයකු වෙනුවෙන් රුපියල් හත්දහස් පන්සියයක් (රු.7500.00) ලියාපදිංචි ගාස්තුව ලෙස ගෙවිය යුතු අතර, එයින් සේවායෝජක සමිතිය හෝ සංගමය හෝ විසින් රුපියල් හයදහසක් ද (රු. 6000.00) දායකයා විසින් රුපියල් එක්දහස් පන්සියයක් ද (රු. 1500.00), දායකයා යෝජනා ක්‍රමයට බැඳුනු දින සිට අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කාලසීමාවක් ඇතුළත එකවර හෝ වාරික කීපයකින් හෝ අධ්‍යක්ෂවරයා වෙත ගෙවිය යුතුය. කෙසේ වුවත් අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන කාලසීමාව වසරක කාලයක් නොඉක්ම විය යුතු ය. උක්ත සඳහන් දායකයාගෙන් අයකර ගත යුතු මුදල දායකයාගෙන් අයකර ගෙන සේවායෝජක සමිතිය හෝ සංගමය හෝ විසින් යෝජනා ක්‍රමය වෙත ගෙවිය යුතුය.

5.V. යෝජනා ක්‍රමයට බැඳී සිටින යම් දායකයකු විශ්‍රාම ලබන දිනට එම දායකයා වෙනුවෙන් යෝජනා ක්‍රමය වෙත ගෙවිය යුතු සම්පූර්ණ දායක මුදල් වටිනාකම ගෙවා නොමැති විටක එම හිඟ දායක මුදල් වටිනාකම පහත පරිදි අය කර ගැනීමට අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතුය.

දායකයා විශ්‍රාම යන අවස්ථාවේ හිමිකම් ලබන ඒකාබද්ධ වැටුප පදනම් කර ගෙන කරනු ලබන ගණනය කිරීම් මත දායකයාගෙන් අයවිය යුතු හිඟ දායක මුදල් වටිනාකමක් පවතී නම් දායකයාගෙන් හා සේවායෝජක සමිතිය / සංගමයෙන් එකී මුදල් අයකරගැනීමට අධ්‍යක්ෂවරයා කටයුතු කළ යුතුය.

නියෝග මාලාවේ 6 වගන්තිය සංශෝධනය කිරීම

05. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 6.I (ආ) හා 6.II(ඇ) වගන්ති ඉවත්කර ඒ වෙනුවට පහත වගන්ති ආදේශ කර හා 6.II(ඈ) ලෙස නව වගන්තියක් ඇතුළත් කිරීමෙන් ද 6 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6.I (ආ). එසේ වුව ද මෙම සංශෝධන නියෝග ක්‍රියාත්මක වන දිනට යම් හෙයකින් වයස අවුරුදු 60 වන විට අවම දායක මුදල වන මාසික වාරික 60 ක මුදල,ගෙවා නිම කිරීමට යම් දායකයෙකුට හැකියාවක් නොමැති නම්, විශ්‍රාම යාමෙන් එක් අවුරුදු උපරිම කාලසීමාවක් ඇතුළත එකී දායක මුදල් ගෙවා නිම කිරීමට එකී දායකයාට හිමිකම් ඇත.

6.II (ඇ). මෙම යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේ දී ඊළඟ උපන්දිනයට වයස අවුරුදු 55ට අඩු දායකයෙකු සම්බන්ධයෙන් වූ විට දී, මෙම නියෝගවල (අ) උපලේඛනයේ වගු අංක 01 හි සඳහන් ආකාරයට අවම මාසික දායක මුදල් ගෙවිය යුතු අතර එම වගුවේ III වැනි තීරයේ සඳහන් ආකාරයට විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත්තේය.

6.II(ඈ). මෙම යෝජනා ක්‍රමයට බැඳෙන අවස්ථාවේ දී ඊළඟ උපන්දිනයට වයස අවුරුදු 55 ට වැඩි වන අවස්ථාවක දී (අ) උපලේඛනයේ වගු අංක 2 හි III තීරයේ සඳහන් ආකාරයට විශ්‍රාම වැටුපක් ලැබීමට හිමිකම් ඇත්තේය.

නියෝග මාලාවේ 7 වගන්තිය සංශෝධනය කිරීම

06. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 7.I හා 7.II වගන්ති ඉවත්කර ඒ වෙනුවට 7.I ලෙස පහත වගන්තිය ආදේශකර 7 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. එසේම 7.III, 7.IV, 7.V, 7.VI හා 7.VI1I යන වගන්ති අංක 7.II, 7.III, 7.IV, 7.Vහා 7.VI ලෙස නැවත අංකනය කිරීමෙන් සංශෝධනය කරනු ලැබේ.

7.I. වයස අවුරුදු 55 ට අඩු දායකයෙකු වූ විට දී විශ්‍රාම වැටුප් හිමිකම ලැබිය හැක්කේ වෛද්‍ය හේතුමත විශ්‍රාම යන්නේ නම් පමණි. ඒ සඳහා 1995 අංක 5 දරන වයඹ පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ප්‍රඥප්තියේ සඳහන් පරිදි සංස්ථාපිත වෛද්‍ය මණ්ඩලයක් මඟින් කරන නිර්දේශ මත පමණක් විශ්‍රාම ගැන්වීම කර තිබිය යුතු අතර, විශ්‍රාම වැටුප් හිමිකම ලැබීමට නම් දායකත්වය ලබා මාස 120ක් දායක මුදල් ගෙවා තිබිය යුතුය.

නියෝග මාලාවේ 8 වගන්තිය සංශෝධනය කිරීම

07. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ "සේවයෙන් ඉල්ලා අස් වූ විට ගෙවනු ලබන ප්‍රතිලාභ" යන පැති සටහන යටතේවන 8 වගන්තිය ඉවත්කර ඒ වෙනුවට 8.I ලෙස පහත වගන්තිය සහ "වැටුප් රහිත නිවාඩු ලබා ඇති විට" යන පැති සටහන යටතේවන 8.I, 8.II, යන වගන්ති නැවත 8.II, 8.III ලෙස අංක කිරීමෙන් ද 8.III වගන්තිය ඉවත්කර 8.IV ලෙස පහත වගන්තිය ආදේශකර 8 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8.I. දායකයෙකු විශ්‍රාම වැටුප් හිමිකම ලැබීමට පෙරාතුව සමුපකාර සේවයෙන් ඉල්ලා අස්වන්නේ නම්, ඔහු යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ ලෙස සැලකිය යුතු අතර එවැනි අයෙකු අධ්‍යක්ෂවරයා වෙත නියමිත ආකෘති මඟින් ලිඛිතව කරන ඉල්ලීමක් මත අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කාරක සභාවේ එකඟත්වය මත තීරණය කරනු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල සහ ඊට අදාළවන පොළිය එකවර ගෙවන ගොනු මුදලක් ලෙස ලැබීමට එකී දායකයාට හිමිකම් ලැබිය හැකිය.

එසේ වුවද සේවා කාලය වසර 2 ක් ගතවී නොමැතිව සේවයෙන් ඉල්ලා අස්වූ විටක ගොනු මුදල ලැබීමට හිමිකම් නොමැත්තේය. එසේ ඉල්ලා අස්වූ දින සිට මාස 06 ක කාලයක් තුළ ලියාපදිංචි සමුපකාර සමිතියක සේවකයෙකු ලෙස සමුපකාර කොමිෂන් සභා ස්ථිර පත්වීමක් ලද හොත් ඉහත කාලය නොසලකා දායකයාගේ ශුද්ධ දායක මුදල සහ ඊට අදාළ වන පොළිය එකවර ගෙවන ගොනු මුදලක් ලෙස ලැබීමට එකී දායකයාට හිමිකම් ලැබිය හැකිය.

8.IV. යම් දායකයකු විධිමත් පරිදි දින 30 ක් හෝ ඊට වැඩි කාලයක් සඳහා වැටුප් රහිත නිවාඩු ලබා සිටින අවස්ථාවක දී හෝ සේවයට නොකැඳවූ විටකදී හෝ එම වැටුප් රහිත සේවා කාලය විශ්‍රාම වැටුප ගණනය කිරීම සඳහා ගණන් නොගත යුතු අතර එම කාලය සඳහා දායක මුදල් ද අය නොකළ යුතු ය.

8. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 11.I.(ඇ) වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කර 11 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. නියෝග මාලාවේ 11 වගන්තිය සංශෝධනය කිරීම

11.I.(ඇ). දායකයාගේ වැන්දඹු භාර්යාව / වැන්දඹු පුරුෂයා ජීවත්ව නොසිටින විටෙක, මුළු මරණ පාරිතෝෂික මුදල රැකියා විරහිත අවිවාහක දරුවන් අතර සමසේ බෙදිය යුතු ය.

"**රැකියා විරහිත**" යන්නට රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථාවල හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල හෝ මධ්‍යම රජයේ/පළාත් සභා සමුපකාර සේවක කොමිෂන් සභාවක් මඟින් ස්ථිර පත්වීමක් ලැබ සමුපකාර සේවයේ යෙදෙන්නන් ඇතුලත් නොවේ.

09. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 12 වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කර 12 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. නියෝග මාලාවේ 12 වගන්තිය සංශෝධනය කිරීම

12. දායකයාගේ යැපෙන්නන් අවස්ථාවෝචිත පරිදි මරණ පාරිතෝෂිකය ලැබීමට හිමිකම් ලබනවිට දී, තමාට එම හිමිකම් ලැබීමට මුල් වූ සිදුවීම පිළිබඳව අවස්ථාවෝචිත පරිදි එම දායකයාගේ යැපෙන්නන් විසින් ඒ මරණය සිදුවීමෙන් දින 180 ක් තුළ දී අදාල හිමිකම සනාථ කිරීමේ ලේඛන සමඟ අධ්‍යක්ෂවරයා වෙත ඉල්ලීම් කරනු ලැබිය යුතු ය.

10. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 15.I වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කර 15 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. නියෝග මාලාවේ 15 වගන්තිය සංශෝධනය කිරීම

15.I. යම්කිසි දායකයකු සමුපකාර සේවයෙන් පහ කරනු ලැබුවහොත් හෝ සේවය අවසන් කරනු ලැබුවහොත් හෝ අනිවාර්ය විශ්‍රාම ගැන්වුවහොත් හෝ තනතුර අතහැර ගිය අයෙකු සේ සළකනු ලැබුවහොත් හෝ යන කරුණු මත තනතුර අහිමි වූ විටක ඔහු,යෝජනා ක්‍රමයෙන් ඉවත් වූ ලෙස සැළකිය යුතු අතර, එවැනි අයෙකු අධ්‍යක්ෂවරයා වෙත ලිඛිතව කරන ඉල්ලීමක් මත, අධ්‍යක්ෂවරයා විසින් උපදේශක කාරක සභාවේ එකහත්වය මත තීරණය කරනු ලබන දායකයාගේ ශුද්ධ දායක මුදල පමණක් ලැබීමට එකී දායකයාට හිමිකම් ලැබිය හැකි ය. එසේ වුවද සේවා කාලය වසර 2 ක් ගතවී නොමැතිව තනතුර අහිමි වූ විටක ශුද්ධ දායක මුදල ලැබීමට හිමිකම් නොමැත්තේය.

නියෝග මාලාවේ 18 වගන්තිය සංශෝධනය කිරීම

11. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 18.I වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කර 18 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

18.I. වයස අවුරුදු 55 සම්පූර්ණ වීමෙන් ඉක්බිතිව,කිසියම් දායකයකු වයස අවුරුදු 60 සම්පූර්ණ වීමට ප්‍රථමයෙන් විධිමත්ව සේවයෙන් විශ්‍රාම ගන්නා විට,ඔහු විශ්‍රාම ගන්නා අවස්ථාව වනවිට ගෙවා සම්පූර්ණ කර ඇති දායක මුදල් වාරික සංඛ්‍යාව හා විශ්‍රාම යන මාසයේ හිමි ඒකාබද්ධ වැටුප පදනම් කරගෙන, මෙම නියෝගවල (අ) උපලේඛනයේ වගු අංක 01 හි III වැනි තීරුවේ දැක්වෙන විශ්‍රාම වැටුපක් ලැබීමට වයස අවුරුදු 60 සම්පූර්ණ වූ දිනය අයත්වන මාසයට පසුව එළඹෙන මාසයේ සිට හිමිකම් ලැබිය යුතු ය.

නියෝග මාලාවේ 21 වගන්තිය සංශෝධනය කිරීම

12. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 21 වගන්තියේ පැති සටහන "විශ්‍රාම වැටුප් ගෙවීම" ලෙස සහ පවතින 21 වගන්තිය 21.IV ලෙස සංශෝධනය කර, පහත වගන්ති 21.I, 21.II සහ 21.III ලෙස ඇතුලත් කර 21 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21.I. විශ්‍රාම වැටුප් අරමුදලේ දායකත්වය ලබමින් සිට නිසි පරිදි විශ්‍රාම ගනු ලැබූ විට විශ්‍රාම වැටුප් ප්‍රදානය කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් තත්කාලයේ නියම කරනු ලබන ලේඛන දායකයා විශ්‍රාම ලැබූ දින සිට දින 90ක් ඇතුලත ඉදිරිපත් කරනු ලැබිය යුතුය. මෙහිදී අදාළ ලේඛන සමඟ විශ්‍රාම වැටුප් හිමිකම් ඉල්ලීමේ ඉල්ලුම් පත්‍රය යොමු කිරීම සේවා යෝජක සමිතියේ/සංගමයේ වගකීමකි. අදාළ ඉල්ලීම යොමු කිරීම විශ්‍රාම ගන්නා දිනයේ සිට දින 90 ඉක්මවා ප්‍රමාද වූ අවස්ථාවක විශ්‍රාම වැටුප ලැබීමට හිමිකම් ලබන ඒකාබද්ධ වැටුප මත පදනම්ව **03.V.(අ)** අනුව අධිභාර ගෙවීමකට සේවා යෝජක සමිතිය/සංගමය යටත් වේ.

21.II. විශ්‍රාම වැටුප් ගණනය කිරීමේදී සාවද්‍ය ගණනය කිරීමක් නිසා ඇතිවන දෝෂයකදී, දායකයා විශ්‍රාම ලබන දිනට අදාළව සිදුවන සේවායෝජක සමිතියේ/සංගමයේ වැටුප් ගෙවීමේ තත්වයේ ඇති වන වෙනසක්, දායකයාගේ සේවා තත්ත්වයේ වෙනසක් හෝ ලේඛන ඉදිරිපත් කිරීමේ දෝෂයක් නිසා පසුව ඇතිවන අනාවරණයක් මත විශ්‍රාම වැටුප් ලාභියාට තම විශ්‍රාම වැටුප සංශෝධනය කර ගැනීමට හිමිකමක් ඇත. එවැනි ඉල්ලීමක්, අවසන් වරට සේවය කරන ලද සමිතිය/සංගමය මඟින් යොමු කළ යුතුය. එම ඉල්ලීම අනුව විශ්‍රාම වැටුප සංශෝධනය කිරීමේ හැකියාව ද, ඒ අනුව ගෙවිය යුතු මුදලක් වේ නම් විශ්‍රාම වැටුප්ලාභියා වෙත ගෙවීමේ බලයද විශ්‍රාම වැටුප් අරමුදල විසින් වැඩිපුර ගෙවන ලද මුදලක් වේ නම් අය කර ගැනීමේ බලයද අධ්‍යක්ෂවරයා වෙත හිමි වේ.

21.III. විශ්‍රාම වැටුප් ලබමින් සිටින දායකයෙකු මිය ගිය විටක අදාළ සනාථ කිරීමේ ලේඛන සමඟ අධ්‍යක්ෂ දැනුවත් කිරීමේ වගකීම අදාළ විශ්‍රාම වැටුප ගෙවනු ලබන ග්‍රාමීය බැංකුව/බැංකුව අයත් සමිතිය/සංගමය විසින් දැරිය යුතුය.

නියෝග මාලාවේ 22 වගන්තිය සංශෝධනය කිරීම

13. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 22 වගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ කර 22 වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

22. මෙම නියෝග මාලාව යටතේ,ගොනු මුදලක් හෝ ශුද්ධ දායක මුදලක් හෝ එකවර ගෙවනු ලබන මුදලක් ලෙස ලැබීමට හිමිකම් ලබන යම් දායකයකු විසින්,තම සේවා යෝජක සමිතිය හෝ සංගමය හෝ සමග නීත්‍යානුකූල ගිවිසුමක් මත ගිවිසගත් යම් මුදලක් එකී සමිතියට හෝ සංගමයට ගෙවීමට ඇති අවස්ථාවකදී, දායකයා විසින් අධ්‍යක්ෂවරයා වෙත කරන ඉල්ලීමක් සලකා බැලීමෙන් අනතුරුව,එසේ ගිවිසගත් මුළු මුදල හෝ ඉන් කොටසක් පියවීම සඳහා දායකයාගේ ගොනු මුදල/ශුද්ධ දායක මුදල සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් හෝ සේවායෝජක සමිතියට හෝ සංගමයට හෝ උපදේශක කාරක සභාවේ එකඟත්වය මත ගෙවිය හැකි ය.

14. සමුපකාර සේවක විශ්‍රාම වැටුප් නියෝග මාලාවේ 25 වන වගන්තිය 25.I ලෙස නැවත අංක කිරීමෙන්ද, ඉක්බිතිව 25.II ලෙස පහත වගන්තිය ඇතුලත් කිරීමෙන්ද 25 වන වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. නියෝග මාලාවේ 25 වගන්තිය සංශෝධනය කිරීම

25.II. යම් සේවකයෙකු කුමන හෝ ආකාරයකින් සේවයෙන් ඉවත් වීමෙන් පසු නැවත එම සමිතියේ/ සංගමයේ හෝ වෙනත් සමිතියක/සංගමයක කුමන හෝ තනතුරක ස්ථිර පත්වීමක් ලැබූ අවස්ථාවක එම පත්වීම් ලැබූ දින සිට නව දායකයෙකු ලෙස යෝජනා ක්‍රමයට දායක විය යුතුය.

15. මෙම නියෝග මාලාවේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවැනි අවස්ථාවකදී සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය. භාෂා අතර අනනුකූලතාවය ක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව

‘ අ ’ උපලේඛනය
වයඹ පළාත් සමුපකාර සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය
වගුව අංක 01:

වයස අවුරුදු 18-55 ත් අතර වයසකදී යෝජනා ක්‍රමයට බැඳෙන සේවකයින් ගෙවිය යුතු වාරික මුදල හා හිමිවන විශ්‍රාම වැටුප් ප්‍රතිශතය

I වැනි තීරය	**II වැනි තීරය**	**III වැනි තීරය**
ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය	දායකත්වය ලද දින සිට විශ්‍රාම ලබන දිනට ගෙවා ඇති වාරික ගණන	වයස අවුරුදු 60 සම්පූර්ණ වී එළඹෙන පළමු මස සිට ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප, විශ්‍රාම ලබන මාසයේ හිමිකම් ලබන ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය
6	504	80
6	492 – 503	79
6	480 – 491	78
6	468 – 479	77
6	456 – 467	76
6	444 – 455	75

I වැනි තීරය	**II වැනි තීරය**	**III වැනි තීරය**
ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය	දායකත්වය ලද දින සිට විශ්‍රාම ලබන දිනට ගෙවා ඇති වාරික ගණන	වයස අවුරුදු 60 සම්පූර්ණ වී එළඹෙන පළමු මස සිට ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප, විශ්‍රාම ලබන මාසයේ හිමිකම් ලබන ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය
6	432 – 443	74
6	420 – 431	73
6	408 – 419	72
6	396 – 407	71
6	384 - 395	70
6	372 - 383	69
6	360 – 371	68
6	348 – 359	67
6	336 – 347	66
6	324 – 335	65
6	312 – 323	64
6	300 -311	63
6	288 – 299	62
6	276 – 287	61
6	264 – 275	60
6	252 – 263	59
6	240 -251	58
6	228 – 239	57
6	216 -227	56
6	204 – 215	55
6	192 - 203	54
6	180 - 191	53
6	168 - 179	52
6	156 - 167	51
6	144 - 155	50
6	132 - 143	49
6	120 - 131	48
6	108 - 119	47

I වැනි තීරය	II වැනි තීරය	III වැනි තීරය
ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය	දායකත්වය ලද දින සිට විශ්‍රාම ලබන දිනට ගෙවා ඇති වාරික ගණන	වයස අවුරුදු 60 සම්පූර්ණ වී එළඹෙන පළමු මස සිට ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප, විශ්‍රාම ලබන මාසයේ හිමිකම් ලබන ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය
6	96 - 107	46
6	84 - 95	45
6	72 - 83	44
6	60 – 71	40

වගුව අංක 02:
වයස අවුරුදු 55 - 60 ත් අතර වයසකදී යෝජනා ක්‍රමයට බැඳෙන සේවකයින් ගෙවිය යුතු වාරික මුදල හා හිමිවන විශ්‍රාම වැටුප් ප්‍රතිශතය

I වැනි තීරය	II වැනි තීරය	III වැනි තීරය	IV වැනි තීරය
ගෙවිය යුතු මාසික දායක මුදල් වාරිකය සඳහා මාසික ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය	ගෙවිය යුතු අවම වාරික සංඛ්‍යාව	වයස අවුරුදු 60 සම්පූර්ණ වන අවස්ථාවේ සිට ජීවිතාන්තය දක්වා හිමිවන විශ්‍රාම වැටුප විශ්‍රාම ලබන මාසයේ හිමිකම් ලබන ඒකාබද්ධ වැටුපෙන් සියයට ප්‍රමාණය	විශ්‍රාම වැටුප හිමි වන අවස්ථාව
6	60	40	වයස අවුරුදු 60 සම්පූර්ණ වන දිනය හෝ අවම දායක මුදල් වාරික 60 ගෙවා අවසන් කළ දිනය යන දෙකෙන් පසුව එළඹෙන මාසයේ සිට

‘ ආ ’ උපලේඛනය

මරණයකදී ගෙවන මරණ පාරිතෝෂිකය

I වැනි තීරය	II වැනි තීරය
යෝජනා ක්‍රමයට බැඳුනු දින සිට සේවා කාලය (මාස වලින්)	හිමිවන මරණ පාරිතෝෂිකය (රුපියල්)
0 – 60	10,000.00
61 – 72	11,000.00
73 – 84	12,000.00
85 – 96	13,000.00
97 – 108	14,000.00
109 – 120	15,000.00
121 – 132	16,000.00
133 – 144	17,000.00

I වැනි තීරය	II වැනි තීරය
යෝජනා ක්‍රමයට බැඳුනු දින සිට සේවා කාලය (මාස වලින්)	හිමිවන මරණ පාරිතෝෂිකය (රුපියල්)
145 – 156	18,000.00
157 – 168	19,000.00
169 – 180	20,000.00
181 – 192	21,000.00
193 – 204	22,000.00
205 – 216	23,000.00
217 – 228	24,000.00
229 – 240	25,000.00
241 – 252	26,000.00
253 – 264	27,000.00
265 – 276	28,000.00
277 – 288	29,000.00
289 – 300	30,000.00
301 – 312	31,000.00
313 – 324	32,000.00
325 – 336	33,000.00
337 – 348	34,000.00
349 – 360	35,000.00
361 – 372	36,000.00
373 – 384	37,000.00
385 – 396	38,000.00
397 – 408	39,000.00
409 සහ 409 ට වැඩි	40,000.00

EOG 11 – 0180

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.